

# කොරියානු භාෂා විශේෂ පරීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම- 2022

## අයදුම්කරුවන් සඳහා උපදෙස්

**විභාග අයදුම්පතක් ලබාගැනීමට නම් ඔබ සම්පූර්ණ කර තිබිය යුතු සුදුසුකම්**

1. වයස් සීමාව අවුරුදු 18 සහ 39 අතර (1982, අගෝස්තු මස 04 සිට 2004 අගෝස්තු මස 03 දක්වා)

2. අයදුම්කරුවන් සිරගතවීමක් හෝ බරපතල දඬුවමකට ලක්වී නොසිටීම.

3. අයදුම්කරුවන් සඳහා කොරියානු ජනරජයෙන් පිටුවහල් කිරීමේ හෝ පිටත්වීමේ නියෝග වාර්තාවක් නොතිබිය යුතුය. කොරියාවේ නීති විරෝධී ලෙස එක් දිනක් හෝ රැඳී නොසිටීම.

4. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමේ තහනමකට ලක්නොකොර තිබීම.

5. E-9 වීසා කාණ්ඩය සහ E-10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වූ සේවා කාලයද ඇතුළුව වසර 05කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති තැනැත්තන් විය යුතුය.

6. කොරියානු රාජ්‍යයේ විදේශගත ශ්‍රමිකයින් සඳහා වන පනතෙහි වගන්ති අංක 18-2 අනුව යම් ශ්‍රමිකයෙකුගේ සේවා කාලය දීර්ඝ කරන ලද අවස්ථාවකදී ඔවුන්ගේ සේවා කාලය වසර 06 ක් වුවහොත් මෙම විභාගය සඳහා ඔවුන් සුදුසුකම් ලබයි.

7. වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවය ඇති අයදුම්කරුවන් හට පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ.

8. කොදු ඇට පෙළේ ආබාධයක් හෝ ඇඟිලි ආබාධ ඇති අයට EPS-TOPIK විභාගයට පෙනී සිටිමට අවස්ථාව නොමැත.

## විභාග අයදුම්පතක් ලබාගැනීමට අවශ්‍ය දෑ

**1.** මෙවර විභාග අයදුම්පත් නිකුත් කිරීම අන්තර්ජාලය ඔස්සේ - මාර්ගගතව(online) සිදු කරන බැවින් ලියාපදිංචි වීමට පෙර පහත සදහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඔබ සතුව තබා ගැනීමට කටයුතු සිදු කරන්න.

**2. ඉදිරියට මාස 06ක කාලයක් සදහා වලංගු විදේශ ගමන් බලපත්‍රයේ ඔබගේ ඡායාරූපය සහිත පිටුවෙහි ස්කෑන් කරන ලද JPG ඡායාරූපයක් (1MB) විය යුතුය.**

3. මාස 03ක් ඇතුළත ලබාගත් 3.5 cm * 4.5 cm ප්‍රමාණයේ **සුදු පැහැති** පසුබිම සහිත පැහැදිලි ස්කෑන් කරන ලද වර්ණ ඡායාරූපයක් JPG විය යුතුය. ( සුදු පැහැති ඇඳුමකින් සැරසී ජායාරූපය ගැනීමෙන් වැළකී සිටිය යුතුය)

- Photo width : 100-300 pixels
- File type: Only JPG
- File Size: 1MB
- ඔබගේ මුහුණ පැහැදිලිව පෙනීම අනිවාර්යය වන අතර,ඡායාරූපය සදහා බෝඩර්,අකුරු ආදිය ඇතුළත් නොකළ යුතුය.
- ශරීරය ඍජුව තබා ඡායාරූපය ලබා ගත යුතුය.
- ඇස් කණ්ණාඩි නොපැළඳ ඡායාරූපය ලබාගත යුතුය.
- **වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවය ඇති අයදුම්කරුවන් හට පරීක්ෂණය සමත්වීමට අවසර නොලැබේ. ඔබ විභාගය සදහා ලියාපදිංචි වන අවස්ථාවේදී ඔබට වර්ණ අන්ධතාවය,වර්ණ දුර්වලතාවයක් නොමැති බවට වෛද්‍යවරයෙකුගෙන් වෛද්‍ය සහතිකයක් ලබාගත යුතු අතර එම වෛද්‍ය සහතිකය මාර්ගගතව(Online) ලියාපදිංචි වනවිට එම අයදුම්පත්‍රය සමඟ ඇමිණිය යුතුය.**
- **තවද, ඔබ විභාගය සමත්වීමෙන් පසුව කොරියානු රැකියා වෙබ් අඩවියට ලියාපදිංචි වීමට පෙර සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයේදී නැවතත් වර්ණ අන්ධතාවය පරීක්ෂාවට ලක් කරනු ලබන අතර එම අවස්ථාවේදී ඔබට වර්ණ අන්ධතාවය ඇති බවට තහවුරු වුවහොත් ඔබගේ විභාග ප්‍රතිඵල අවලංගු වනු ලැබේ.**

## 4. විභාග අයදුම්පත් ගාස්තුව- ඇමරිකානු ඩොලර් 28 ට සමාන රුපියල් අගය (රු.10,109/- )

මෙම අයදුම්පත් ගාස්තුව ගෙවීම් කිරීමේදී ඔබට ආසන්නතම ජාතික ඉතිරිකිරීමේ බැංකුව,ලංකා බැංකුව හා මහජන බැංකුවෙහි පහත සදහන් ගිණුම් අංකය වෙත බැර කිරීම සිදු කළ යුතුය.

- 100-800-44-2461 - ජාතික ඉතිරි කිරීමේ බැංකුව (බත්තරමුල්ල ශාඛාව)
- 0000001650 - ලංකා බැංකුව ( ආයතනික ශාඛාව)
- 20810015179-1068 - මහජන බැංකුව (බත්තරමුල්ල ශාඛාව)

- ලියාපදිංචිය සිදු කරනු ලබන අවස්ථාවේදීම ඔබට මුදල් ගෙවීම සඳහා බැංකුව වෙත යාමට අපහසු බැවින් **2022.08.08 සිට 2022.08.09 ප.ව.12.00** දක්වා පමණක් මුදල් ගෙවීමට අවස්ථාව ලබාදේ.
- මුදල් ගෙවූ රිසිට්පත ස්කෑන් කර (File Size: 1MB) තබා ගැනීමට කටයුතු කළ යුතුය.**Online/ATM භාවිතයෙන් ගෙවීම් සිදු කිරීම් සිදු කළ නොහැක.**

**බැංකු රිසිට්පත සම්පූර්ණ කිරීමේදී අනිවාර්යෙන්ම ඔබගේ නම,ලිපිනය, විදේශ ගමන් බලපත්‍ර අංකය, ජාතික හැදුනුම්පත් අංකය,දුරකථන අංකය සහ ඔබගේ ගමන් බලපත්‍ර යේ සඳහන් අත්සන පැහැදිලිව සටහන් කළ යුතුය.එසේ නොවන රිසිට්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.කිසිදු තොරතුරක් සටහන් නොකර මුදල් ගෙවීම් සිදු කරන රිසිට්පත්ද ප්‍රතික්ෂේප වේ.**

**එසේම ඉහත දින 03න් පසුව ගෙවීම් කරනු ලබන රිසිට්පත්ද මේ සඳහා අයදුම් කිරීමේදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වර්ණ කර ඇති සියලුම විස්තරයන් සම්පූර්ණ කළ යුතුය.**

## මහජන බැංකුව | மக்கள் வங்கி — PEOPLE'S BANK

මුදල් තැන්පතු පත - ඉතුරුම් பண வைப்புச்சீட்டு – சேமிப்பு
**CASH DEPOSIT SLIP - SAVINGS**

ආ. ප./ப. இ. Form No. 213/1 DP

| | |
|---|---|
| දිනය/திகதி Date | |
| ගිණුම් අංකය/கணக்கு இலக்கம் Account Number | 2 0 8 1 0 0 1 5 1 7 9 1 0 6 8 |
| ගිණුම් හිමියාගේ නම / கணக்குரிமையாளரின் பெயர் / Name of Account Holder | S.L.B.F.E. |
| මුදල අකුරින් / தொகை எழுத்தில் / Amount in words (රු/ரூ/Rs) | දහදහස් එකසීය නවයක් පමණි. |

ගිණුම් හිමියා නොමැතිව වෙනත් පාර්ශවයක් විසින් කරන රු. 200,000ට වැඩි මුදල් තැන්පතු සඳහා
கணக்குரிமையாளரன்றி வேறொருவர் ரூபா 200,000க்கு மேல் பணவைப்புச் செய்யும்போது
For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder

| | |
|---|---|
| නම/பெயர்/Name | ඔබගේ නම ලියන්න. |
| ලිපිනය/முகவரி/Address | ලිපිනය ලියන්න |
| දුරකථන අංකය/தொலைபேசி இல./Telephone No. | දුර: අං: |
| ජාතික හැඳුනුම් පත්/විදේශ ගමන් බලපත්/රියදුරු බලපත් අංකය / தே.அ.அ/கடவுச்சீட்டு/சாரதி அனுமதிப்பத்திர இல./NIC/PP/D.L. No. | ගමන් බලපත්‍ර අංකය ලියන්න. |
| හේතුව/காரணம்/Purpose | ගමන් බලපත්‍ර අංකය ලියන්න. |
| මුදල් තැන්පත්කරන්නාගේ අත්සන / பண வைப்பாளரின் கையொப்பம் / Cash Depositor's Signature | ඔබගේ අත්සන ලියන්න. |
| මුදල් භාරකරුගේ අත්සන / காசாளரின் கையொப்பம் / Cashier's Signature | |

| නෝට්ටු/தாள்கள் Notes | රුපි./ரூபா/Rs. | ශත/சதம் Cts. |
|---|---|---|
| ....... x 5000 | | |
| ....... x 2000 | | |
| ....... x 1000 | | |
| ....... x 500 | | |
| ....... x 200 | | |
| ....... x 100 | | |
| ....... x 50 | | |
| ....... x 20 | | |
| ....... x 10 | | |
| කාසි/நாணயங்கள் Coins | | |
| එකතුව/மொத்தம் Total | 10109 | 00 |

මෙම ඉරට පහළින් කිසිවක් නොලියන්න / இக் கோட்டுக்குக் கீழே எதுவும் எழுத வேண்டாம் / DO NOT WRITE ANYTHING BELOW THIS LINE

**ඉතුරුම්**
**சேமிப்பு**
**SAVINGS**

Form 213/1 DP S/T/E Rev. Feb. 2017 — PB DTPU

---

## NSB — NATIONAL SAVINGS BANK
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
தேசிய சேமிப்பு வங்கி

**CASH DEPOSITS**
මුදල් තැන්පතු / பண வைப்பு

| | |
|---|---|
| Signature / අත්සන / ஒப்பம் | ඔබගේ අත්සන සදහන් කරන්න. |
| Date / දිනය / திகதி | |
| Name / නම / பெயர் | S.L.B.F.E. |
| Bill / Account No. / බිල්පත් / ගිණුම් අංකය / பற்றுச் சீட்டு / கணக்கு இலக்கம் | 100 800 44 2461 |
| Amount (Rs.) / මුදල (රු.) / தொகை (ரூபா) | 10,109.00 |
| Amount in Words / මුදල අකුරෙන් / சொற்களில் தொகை | රුපියල් දහදහස් එකසිය නවයකි. |
| Received Passbook/ පාස්පොත ලැබුණා / பணவைப்புப் புத்தகத்தைப் பெற்றுக்கொண்டேன் | |

For Cash deposits of Rs. 200,000/- or above made by a person other than the account holder
ගිණුම් හිමියා නොවන අයෙකු විසින් තැන්පත් කරනු ලබන රු. 200,000/- හෝ ඊට වැඩි මුදල් තැන්පතු සඳහා
கணக்கு உரிமையாளர் இன்றி வேறொருவர் ரூபா 200,000/- அல்லது அதற்கு மேல் வைப்புச் செய்வதற்கு

| | |
|---|---|
| Depositor's Name / තැන්පත්කරුගේ නම / வைப்பாளரின் பெயர் | ඔබගේ නම පැහැදිලිව සදහන් කරන්න. |
| Depositor's Address / තැන්පත්කරුගේ ලිපිනය / வைப்பாளரின் முகவரி | ලිපිනය ලියන්න. |
| NIC No. / ජා.හැ.ප. අංකය / தே.அ.அ.இல. | ජා: හැ: අං: ලියන්න. |
| Tel. No. / දු. අංකය / தொ.பே.இல. | දුර: අං: ලියන්න. |
| Purpose of Deposit / තැන්පත් කිරීමට හේතුව / வைப்பின் நோக்கம் | ඔබගේ විදේශ ගමන් බලපත්‍ර අංකය ලියන්න. |

| Notes / නෝට්ටු / தாள்கள் | Rs. / රුපියල් / ரூபா | Cts. / ශත / சதம் |
|---|---|---|
| 5000 X | | |
| 2000 X | | |
| 1000 X | | |
| 500 X | | |
| 100 X | | |
| 50 X | | |
| 20 X | | |
| Other / අනෙකුත් / ஏனையவை | | |
| Total / එකතුව / மொத்தம் | 10,109 | 00 |

For office use only / කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි / அலுவலகப் பாவனைக்கு மட்டும்

Teller / අයකැමි / காசாளர்

Vaild if overprinted or signed by an officer / යන්ත්‍ර මුද්‍රාව හෝ නිල අත්සන ඇත්නම් වලංගුයි/ இயந்திர பதிவு அல்லது உத்தியோகபூர்வ கையொப்பம் இருப்பின் செல்லுபடியாகும்

UDAYA GRAPHICS

---

## BANK OF CEYLON — BOC
Bankers to the Nation

BOC/Supp/S 210942

මුදල් තැන්පතු පත්‍රිකාව பண வைப்புச் சீட்டு **Cash Deposit Slip**

දිනය / திகதி / Date: D D M M Y Y Y Y

ගිණුම් / කාඩ්පත් අංකය கணக்கு/அட்டை இலக்கம் Account / Card Number: 0 0 0 0 0 0 1 6 5 0

ගිණුම් / කාඩ්පත් හිමියාගේ නම සහ ලිපිනය
கணக்கு/அட்டை வைத்திருப்பவரின் பெயரும் முகவரியும் :
Account / Card Holder's Name and Address : S.L.B.F.E.

ගිණුම් / කාඩ්පත් හිමියා නොමැතිව වෙනත් පාර්ශවයක් විසින් කරන රු. 200,000ට වැඩි මුදල් තැන්පතු සඳහා
கணக்குரிமையாளர்/அட்டை வைத்திருப்பவர் அல்லாது மற்றவர்களால் மேற்கொள்ளப்படும் ரூ.200,000/-இற்கு அதிகமான வைப்புகளுக்கு
For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder

| | |
|---|---|
| තැන්පත්කරුගේ නම සහ ලිපිනය / வைப்புச் செய்பவரின் பெயரும் முகவரியும் Depositor's Name and Address | ගමන් බලපත්‍රයේ සදහන් පරිදි ඔබගේ නම ලියන්න. |
| ජා.හැ.අ. / ගමන් බලපත් / රියදුරු බලපත් අංකය / தே.அ.அ./கடவுச்சீட்டு/சாரதி அனுமதிப்பத்திர இல. / N.I.C / P.P / D.L No.: | ගමන් බලපත්‍ර අංකය ලියන්න. |
| දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No: | දුර: අංකය සදහන් කරන්න. |
| තැන්පතුවේ අභිප්‍රායය / வைப்பின் நோக்கம் / Purpose of Deposit: | ගමන් බලපත්‍ර අංකය ලියන්න. |
| Ref No. | |
| තැන්පත්කරුගේ අත්සන / வைப்புச்செய்பவரின் ஒப்பம் / Depositor's Signature | ඔබගේ අත්සන ලියන්න. |

පරිගණක මුද්‍රණ හෝ නිල අත්සන් ඇත්නම් වලංගුයි / கணனி அச்சீடு அல்லது அதிகார ஒப்பம் இருப்பின் செல்லுபடியாகும் / Valid Computer Print or Authorised Signature

| නෝට්ටු / தாள்கள் / Notes | රුපියල් / ரூபா. / Rs. | ශත / சதம். / Cts. |
|---|---|---|
| 5000 /- | | |
| 2000 /- | | |
| 1000 /- | | |
| 500 /- | | |
| 200 /- | | |
| 100 /- | | |
| 50 /- | | |
| 20 /- | | |
| 10 /- | | |
| කාසි / குத்திகள் / Coins | | |
| එකතුව / மொத்தம் / Total | 10 109 | 00 |

Credit 1-2 Form No : 70175 — GRAPHIC SYSTEMS - B

Validation checked

Signature

ඔබට කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් පවත්වනු ලැබූ සහාය පුහුණු වැඩසටහන් වලට අදාළව පහත සඳහන් සහතික තිබේ නම් ඔබ විභාග ගාස්තු ගෙවීමට අවශය නොවේ.ඒ බව ඉහතින් Admission free ලෙස පෙන්වා ඇත්නම් ඔබ විභාග අයදුම්පත් ගාස්තු ගෙවිය යුතු නැත.

## අමතර ලකුණු ලබාදීම සහ විභාග අයදුම්පත් ගාස්තුවෙන් නිදහස් කිරීම

<table>
<tr><td colspan="5">අමතර ලකුණු</td><td>විභාග අයදුම්පත් ගාස්තුවෙන් නිදහස්කිරීම (ඔව්/නැත)</td></tr>
<tr><td rowspan="4"><u>(A)</u><br>කොරියාවේදී පවත්වනු ලබන ආපසු සියරට පැමිණෙන ශ්‍රමිකයින් සඳහා වන සහාය පුහුණු වැඩසටහන</td><td>වසර</td><td colspan="2">කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය 3වන මට්ටමට අදාළ පාඨමාලාව(උපරිම ලකුණු 20)</td><td>රැකියා සඳහා රැකියා කුසලතා පුහුණුව/ව්‍යාපාර ආරම්භය</td><td rowspan="4">අමතර ලකුණු හිමි වේ.<br>විභාග අයදුම්පත් ගාස්තු අයකරගනු නොලැබේ.</td></tr>
<tr><td rowspan="2">2016</td><td>සම්පූර්ණ කිරීම</td><td>කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය 3වන මට්ටමට අදාළ පුහුණුව හෝ ඉන් ඉහළ ඇති අය</td><td>සම්පූර්ණ කිරීම</td></tr>
<tr><td>-</td><td rowspan="2">ලකුණු 20</td><td rowspan="2">ලකුණු -5</td></tr>
<tr><td>2017 සිට</td><td>ලකුණු 5</td></tr>
<tr><td><u>(B)</u> සෘතුමය රැකියා සඳහා පිටත්ව යාම</td><td colspan="4">සෘතුමය රැකියා සඳහා පිටත්ව යාම (10 points)</td><td>අමතර ලකුණු හිමි වේ.විභාග අයදුම්පත් ගාස්තු ගෙවිය යුතුය.</td></tr>
</table>

| (C)<br>U-turn company worker | කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය 3වන මට්ටමට අදාළ පාඨමාලාව(උපරිම ලකුණු 20) | අමතර ලකුණු හිමි වෛ.විභාග අයදුම්පත් ගාස්තු ගෙවිය යුතුය. |
|---|---|---|

※ කොරියාවේදී පවත්වනු ලබන ආපසු සියරට පැමිණෙන ශ්‍රමිකයින් සඳහා වන සහාය පුහුණු වැඩසටහන සම්පූර්ණ කර ඇති ඔබ,අදාළ සහතික මේ සමඟ ඇති ඇමුණුමට අනුව අදාල අයදුම්පත්‍රය සම්පූර්ණ කර ලියාපදිංචියේදී උඩුගත කළ යුතුය.

※ කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණයේ 3 වන මට්ටම හෝ ඉන් ඉහළ ඇති අය එම සහතිකය පමණක් නොව කොරියානු අධ්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධ සහතිකයද ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.